**මාතර ප්‍රාදේශීය සභාව**
**මාතර දිස්ත්‍රික්කය**
**--------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
**----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 15 දිනද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට මාතර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**---------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

සමාලෝචිත වර්ෂයේ අවසානයට එක් වාහනයක වටිනාකම රු.2,490,398 ක් වැඩියෙන්ද, තවත් වාහන දෙකක වටිනාකම රු.7,316,537 ක් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

#### 1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
---------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට අවුරුදු 03 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂ 11 ක එකතුව රු.59,884,738 ක් වූ අතර අවුරුදු 03 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 08 ක එකතුව රු. 24,710,415 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට මාතර මහා නගර සභාවෙන් එකතුව රු.1,942,225 ක ශේෂයක් අයවිය යුතු ලෙස දැක්වුවද, මාතර මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන වල එවැනි ශේෂයක් දක්නට නොලැබුණි.

(ඇ) ඉකුත් වර්ෂවල සිට ඉදිරියට ගෙනෙමින් පවතින රු.44,017 ක මුද්දර බදු, රු.229,380 ක එකතු කල අගය මත බදු හා රු.45,338 ක ජාතිය ගොඩනැගීමේ බදු මුදල් නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

එකතුව රු.58,226,232 ක් වූ ඉඩම් සම්බන්ධයෙන් හිමිකම් ඔප්පු හා පැවරුම් ලේඛනද, රු.21,981,649 ක් වූ කර්මාන්ත ණයගැති හා රු.22,452,139 ක් වූ ණයහිමි ශේෂ සම්බන්ධයෙන් උපලේඛන, ලිපිගොනු හා ශේෂ තහවුරු කිරීම්ද, රු.23,592,358 ක් වූ හිඟ හිටි ප්‍රාග්ධන ආධාර හා රු.7,931,031 ක් වූ හිඟ හිටි ආදායම් ආධාර සම්බන්ධයෙන් ආධාර ලේඛනය හා විස්තරාත්මක උපලේඛනද, රු.2,714,653 ක වියදමට අදාළ මෝටර් රථ 15 ක දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශද ඉදිරිපත් නොකිරීම නිසා එම ගනුදෙනු සම්බන්ධයෙන් පරීක්ෂා කර තහවුරු කර ගැනීමට විගණනයේදී නොහැකි විය.

### 1.3.4 නීති, රීති සහ රෙගුලාසි ආදියට අනුකූල නොවීම

-------------------------------------------------------

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 261 (3) ට අනුකූල නොවී මුදල් පොතේ ශේෂයක් නොතිබියදී රු.264,583 ක චෙක්පත් නිකුත් කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.24,096,340 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.12,009,842 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.12,086,498 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණු රු.4,677,092 ක ප්‍රාග්ධන ආධාර ප්‍රමාණය ඉක්මවා රු.2,356,982 ක ප්‍රාග්ධන වියදම් දරා තිබුණි.

### 2.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය

--------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම්වල සියයට 9.5 ක අඩුවීමක් පෙන්නුම් කළද, මුළු පුනරාවර්තන ආදායමින් මුළු පුනරාවර්තන වියදම සියයට 67 ක් තරම් ඉහළ මට්ටමක පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ දෙක තුළ සභාවේ මුළු පුනරාවර්තන ආදායම ආදායම් ආධාර, ස්වයං උත්පාදන ආදායම් සහ මුළු පුනරාවර්තන වියදම් පිළිබඳ සාරාංශගත විස්තරයක් පහත දැක්වේ.

| වර්ෂය | මුළු පුනරාවර්තන ආදායම් | ආදායම් ආධාර මුදල | ස්වයං උත්පාදන ආදායම | මුළු පුනරාවර්තන වියදම | ස්වයං උත්පාදන ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| 2015 | 73,238,787 | 36,189,968 | 37,048,819 | 49,142,448 | (12,093,629) |
| 2014 | 52,273,818 | 21,774,125 | 30,499,693 | 40,263,976 | (9,764,283) |
| 2013 | 38,365,975 | 18,812,585 | 19,553,390 | 40,787,313 | (21,233,923) |

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂ දෙක සමඟ සැසඳීමේදී ආදායම් සමාලෝචිත වර්ෂයේ ආධාර හා ස්වයං උත්පාදන ආදායම්වල වර්ධනයක් පෙන්නුම් කරන අතර, සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වියදමද සැලකිය යුතු අගයකින් වර්ධනය වී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී මෙන්ම ඉකුත් වර්ෂවලදීද ආදායම් ආධාර නොලැබෙන්නට ස්වයං උත්පාදිත ආදායම් වලින් පුනරාවර්තන වියදම් පියවා ගැනීමට නොහැකි තත්ත්වයක් පැවතුණි.

## 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ ජංගම හා ක්ෂණික අනුපාත සතුටුදායක මට්ටමක් පෙන්නුම් කළද, ණයගැති ශේෂය තුළ වසර 03 ක කාලයක් ඉක්මවා අයනොවී පවතින රු. 59,884,738 ක ශේෂ පැවතීමෙන් ජංගම අනුපාතය ප්‍රකාරවම ද්‍රවශීලතා තත්ත්වයක් නොපවතින බව නිරීක්ෂණය විය.

## 2.4 ආදායම් පරිපාලනය

### 2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

2015 වර්ෂය සඳහා සභාවේ ආදායම් විෂයයන් 05 ක් යටතේ ඇස්තමේන්තු කර තිබුණු රු.10,077,185 ක මුළු පුනරාවර්තන ආදායමින් රැස්කර තිබුණේ රු.4,570,216 ක් පමණි. ඒ අනුව ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 45 ක් විය.

### 2.4.2 වරිපනම් බදු

----------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට හිඟයෙන් සියයට 43 ක් හා බිල්කිරීම් වලින් සියයට 58 ක් පමණක් අයකිරීම නිසා අවසාන හිඟ ශේෂය රු.2,446,730 ක් තරම් ඉහළ අගයක් ගෙන තිබුණි. හිඟ ආදායම් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) වගන්තිය අනුව කටයුතු කර නොතිබුණි.

### 2.4.3 අක්කර බදු

--------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භක හිඟයෙන් සියයට 7 ක් හා බිල්කිරීම් වලින් සියයට 59 ක් පමණක් අයකර ගැනීම නිසා අක්කර බදු අයකිරීම සතුටුදායක මට්ටමක නොපැවතින.

### 2.4.4 කුලී ආදායම්

----------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) (ආ) වගන්තිය අනුව කටයුතු නොකිරීම නිසා ආරම්භක හිඟ ශේෂයෙන් සියයට 46 ක් පමණක් අයකර තිබුණි.

### 2.4.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.4,546,400 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.20,000,000 ක් අයවිය යුතුව තිබුණි.

### 2.4.6 කඩකාමර කුලී

-----------------

ස්වර්ණපුර පැවති කඩකාමර 2005 වර්ෂයේදී ඉවත් කරන විට රු.184,024 ක හිඟ බදු කුලී ශේෂයක් පැවැති නමුත්, විධිමත් ගිවිසුම් වලට එළැඹී නොතිබීම නිසා හිඟ මුදල් අයකිරීමට ක්‍රියාමාර්ග ගත නොහැකිව තිබුණි. මෙම ශේෂයෙන් රු.116,313 ක් අයකර ගැනීමට මාතර දිස්ත්‍රික් උසාවියෙන් නියෝගයක් ලබා දී තිබූ නමුත්, එම මුදල් අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතුව පැවති බැංකු ජංගම ගිණුම් වලට අදාළ මුදල් පොත් අනුව රු.12,152,061 ක මාසික සාමාන්‍ය ශේෂයක් පැවති නමුත්, එම මුදල් ආයෝජනය කර අතිරේක පොලී ආදායම් උපයා ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට ජල ගිණුමට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශයෙහි දැක්වෙන රු.80,667 ක් වූ වැඩිපුර තැන්පත් කිරීම් හා රු.600,819 ක් වූ ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් 04 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

-----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) "ගමින් ගමට දොරින් දොරට" ව්‍යාපෘතියේ ප්‍රතිපාදිත මුදල් සභාවට ලැබීමට පෙර කර්මාන්ත ආරම්භ කර සභා අරමුදලින් රු.3,570,187 කවියදම් දරා තිබුණු නමුත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මෙම වියදම් ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි.

(ආ) සභා තීරණයකින් අනුමැතිය ලබා නොගෙන එකතුව රු.2,500,000 ක් වූ ස්ථාවර තැන්පත්, කල්පිරීමට පෙර මුදල් කර, එම මුදල් සභාවේ රැස්කිරීමේ ජංගම ගිණුම් 02 ක තැන්පත් කිරීම නිසා උපයාගත හැකිව තිබූ රු.728,100 ක පොලී ආදායම් සභාවට අහිමි වී තිබුණි.

**4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

---------------------------------------

**4.1 අයවැය පාලනය**

------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී සම්මත කරගෙන තිබූ වැඩ යෝජනා 192 ක් සඳහා අයවැය ලේඛනයෙන් රු.145,600,000 ක ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසාගෙන තිබුණද, ඉන් කිසිදු යෝජනාවක් ක්‍රියාත්මක කර නොතිබුණි. එසේ තිබියදී සභා අරමුදලින් රු.279,777 ක් වැය කර අනුමත කරගෙන නොතිබූ වැඩ යෝජනා 06 ක් ක්‍රියාත්මක කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයන් 08 ක එකතුව රු.175,875,362 ක ඉතිරි කිරීම් විය. වෙනත් වියදම් විෂයයක අනුමත සීමාව ඉක්මවා රු.2,798,183 ක වියදම් දරා තිබූ අතර, ආදායම් විෂයයන් 07 ක ළඟාකර නොගත් ඉලක්කගත ආදායම් එකතුව රු.144,367,075 ක් විය. මේ නිසා අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**4.2 අභ්‍යන්තර විගණනය**

**------------------------**

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ 2005 නොවැම්බර් 08 දිනැති අංක 03 දරන පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛයේ 8 ඡේදය පරිදි අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

**4.3 විගණන හා කළමනාකරණ කමිටුව**

**-------------------------------------**

2000 මාර්තු 15 වැනි දිනැති අංක පීඑන්/පීඊ/පී.7 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට යොමු දක්වමින් 2004 දෙසැම්බර් 22 දිනැතිව පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් නිකුත් කර ඇති මාර/වාස/වි/ක ලිපිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවා නොතිබුණි.

**4.4 නොවිසඳී ඇති විගණන විමසුම්**

**---------------------------------**

ඉකුත් වර්ෂයට අදාළ ගණනය කළ හැකි වටිනාකම රු.3,448,462 ක් වූ විගණන විමසුම් දෙකකට අදාළ නිවැරදි කිරීම් සමාලෝචිත වර්ෂයේදීත් සිදු කර නොතිබුණි.

**5. පද්ධති හා පාලනය**

------------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) මූල්‍ය පාලනය
(ඇ) අයවැය පාලනය
(ඈ) ආදායම් පරිපාලනය
(ඉ) වත්කම් කළමනාකරණය